**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර ආරක්ෂක නිලධාරි තනතුරේ සේවය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට සලකා බැලීම වෙනුවෙන් ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් විශේෂ කාර්ය බලකායේ නිත්‍ය සේවයේ රාජකාරි කරන ලද සුදුසුකම්ලත් මනා පළපුරුද්දක් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

# සහකාර ආරක්ෂක නිලධාරි තනතුර (කොන්ත්‍රාත් පදනම මත)

## 1.0 කාර්යය/වගකීම්:

- ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලු ම සේවකයින්ට තම කාර්යයන් ප්‍රශස්ත මට්ටමින් ඉටු කිරීමට පහසුකම් සැලසීම සඳහා සුදුසු ආරක්ෂිත වටපිටාවක් සහතික කිරීම.
- ඇති විය හැකි බාහිර අවදානම්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින්, පිටතින් පැමිණෙන්නන් සහ එහි දේපළ ආරක්ෂා කිරීම.

## 2.0 අවශ්‍ය අවම සුදුසුකම්:

### 2.1 අධ්‍යාපන සුදුසුකම්

අ.පො.ස (සා/පෙ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් හයක් (06) එක් වරක දී සමත් ව තිබීම.

### 2.2 ශාරීරික යෝග්‍යතාව

උස (i) පිරිමි : සෙන්ටිමීටර 167.5 (5′ 6″) හෝ වැඩි
(ii) ගැහැණු: සෙන්ටිමීටර 162.5 (5′ 4″) හෝ වැඩි

බර (i) පිරිමි : 20 < ශරීර ස්කන්ධ දර්ශකය < 27
(ii) ගැහැණු: 17 < ශරීර ස්කන්ධ දර්ශකය < 25

පපුව (i) පිරිමි : 81.3 cm (32″) (අවම)

සියලුම අයදුම්කරුවන් රටේ ඕනෑ ම ප්‍රදේශයක සේවය කිරීම සඳහා වෛද්‍යමය වශයෙන්, මානසික ව සහ ශාරීරික ව යෝග්‍ය විය යුතු ය.

### 2.3 වයස

පිරිමි : 22.03.2026 දිනට අවුරුදු 40ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

ගැහැණු: 22.03.2026 දිනට අවුරුදු 35ට නොඅඩු සහ අවුරුදු 40ට නොවැඩි විය යුතු ය.

### 2.4 පළපුරුද්ද:

පිරිමි පුද්ගලයින් සඳහා අවම වශයෙන් අවුරුදු 22ක සහ කාන්තාවන් සඳහා අවම වශයෙන් අවුරුදු 15ක කාලයක් ත්‍රිවිධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ නිත්‍ය සේවයේ නිකැළැල් අඛණ්ඩ සේවයක් සපුරා තිබීම.

විශේෂ බලකා, පුපුරණ ද්‍රව්‍ය, විනය ආරක්ෂක, අවි ආයුධ හෝ ශාරීරික පුහුණු උපදේශක, ගිනි ආරක්ෂක, සන්නිවේදන, බුද්ධි අංශ වැනි ක්ෂේත්‍රවල විශේෂඥතාව අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

### 2.5 ත්‍රිවිධ හමුදාවේ/ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ දැරූ නිලය:

ශ්‍රී ලංකා යුධ, නාවික හෝ ගුවන් හමුදාවේ සැරයන්/සුළු නිලධාරී හෝ ඊට ඉහළ නිලයක් දැරූ හෝ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ සැරයන් හෝ ඊට ඉහළ නිලයක් දැරූ විශ්‍රාමික කොමිෂන් නොලත් නිලධාරියෙකු විය යුතු ය.

## 3.0 රැකියාව:

වසර තුනකට (03) නොවැඩි කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනේ. ආරම්භයේ දී වසරක (01) කාලයක් සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කරනු ලබන අතර, එක් එක් වසර අවසානයේ දී අදාළ නිළධාරියාගේ කාර්ය සාධනය සහ බැංකුවේ අවශ්‍යතා මත පදනම් ව ගිවිසුම දීර්ඝ කිරීමට සලකා බලනු ඇත. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන නිලධාරීන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථිර සේවක මණ්ඩලයට අන්තර්ග්‍රහණය කර ගැනීම සිදු කරනු නොලැබේ.

## 4.0 වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ:

රු. 100,000.00ක බද්දට යටත් මාසික දීමනාවක්, සහ සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තිකයන්ගේ අරමුදල (ETF) සඳහා දායකත්වය

## තෝරා ගැනීමේ ක්‍රමවේදය

ලිඛිත පරීක්ෂණයකින් අනතුරු ව පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සහ සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් මත පදනම් ව සුදුසු අපේක්ෂකයන් තෝරා ගනු ලැබේ.

## අයදුම්පත්

සුදුසුකම් සහ පළපුරුද්ද සහිත උනන්දුවක් දක්වන අයදුම්කරුවන් සිය අයදුම්පත් **පහත සබැඳිය ඔස්සේ** මාර්ගගත ව 2026.03.22 දිනට පෙර යොමු කළ යුතු ය.
**සබැඳිය:** https://www.cbsl.lk/Recruitments/

අයදුම්පත ඉදිරිපත් කිරීමේ දී ඉහත සබැඳියේ ඇති බඳවා ගැනීම් වෙබ් පිටුවේ පවතින නියමයන් සහ කොන්දේසිවලට අනුගත වන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය සවිස්තරාත්මක උපදෙස් වෙත ද එම සබැඳිය ඔස්සේ ප්‍රවිෂ්ට විය හැකි ය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අදාළ අවම සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් මෙම තනතුර සඳහා සලකා බලනු නොලැබේ. නියමිත දිනට පසුව ලැබෙන හෝ අවශ්‍යතා සපුරා නොමැති හෝ නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කර නොමැති අයදුම්පත්, කිසිදු දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඉහත තනතුර සඳහා අවශ්‍ය අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සහතික කිරීම සඳහා වන ලේඛනවල ස්කෑන් කරන ලද පිටපත් උඩුගත කරන ලෙසට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.
**(උදා., උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, අ.පො.ස. (සා.පෙළ) සහ (උ.පෙළ) සහතිකපත්, ත්‍රිවිධ හමුදා සේවා පොත/ ශ්‍රී ලංකා පොලීසියේ සේවා සහතික, වෙනත් සුදුසුකම් සහතික සහ වෙනත් අදාළ ලේඛන)**

සම්මුඛ පරීක්ෂණයට පෙර සහතික පත්‍ර පරීක්ෂා කරන අවස්ථාවේ දී අදාළ සහතික පත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා පත් කර ගනු නොලැබේ.

තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ. තනතුර සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීම හෝ බඳවා ගැනීම කල් දැමීම හෝ බඳවා ගැනීම අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය. බඳවා ගැනීමේ නිර්ණායක අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයින් පමණක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ මීළඟ පියවර සඳහා කැඳවනු ලැබේ.

**අධ්‍යක්ෂ – මානව සම්පත්**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.**
**දුරකථන : 011-2477330 ෆැක්ස් : 011-2477715**